# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/02/01/චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / Your No: ..............................................
දිනය / திகதி / Date: 2022.04.07

සියළුම විධායක කමිටු /පාලක මණ්ඩල සභාපතිවරුන්,
සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති කළමණාකරුවන් වෙත.

<u>විදුලිය ඇනහිටින අවස්ථාවල, සමෘද්ධි බැංකු සහ බැංකු සමිතිවල මෙහෙයුම් කටයුතු පරිගණක මෘදුකාංගය හරහා සිදු කිරීම සඳහා උපදෙස් ලබාදීම.</u>

01. පරිගණක මෘදුකාංගය හරහා මෙහෙයුම් කටයුතු කරන බැංකුවල විදුලිය ඇනහිටීම හේතු කරගෙන යම් දිනක / දිනවල සිදුවූ ගණුදෙනු පරිගණක මෘදුකාංගයට ඇතුලත් කිරීමට අපොහොසත් වන විටක, ඊට පසු රාජකාරී ඉටු කරන දිනයේ දී SOD ක්‍රියාත්මක කර, පළමුව පෙර දිනට/ දිනවල අදාල ගණුදෙනු ඇතුලත් කිරීම සිදුකර අවසන් කල යුතුය. ඉන් අනතුරුව දවසේ ගණුදෙනු ඇතුලත් කල යුතුය.

    එසේ සිදුකල පසු, මෘදුකාංගයේ සහ manual යන දෙකේම පොදු ලෙජරය සහ පුද්ගලික ණය තැන්පතු ලෙජර් ශේෂයන් තුලනය වී තිබිය යුතුය. මෙම කර්යය සිදුකරන විටක ලොග් සටහනක් තබා කටයුතු කල යුතුය.

02. බැංකු සතු විදුලි ජනක යන්ත්‍රයක් නොමැති විටක විදුලිය ඇණසිටින අවස්ථාවක බැංකු කටයුතු ප්‍රමාදයකින් තොරව සිදු කර ගැනීමට කුලී පදනම යටතේ විදුලි ජනක යන්ත්‍රයක් පාලක මණ්ඩලය අනුමැතිය මත ලබාගැනීමට ද ඉඩ දෙනු ලැබේ. පාලක මණ්ඩලය සමඟ සාකච්ජා කර, මූල්‍ය විනිවිද භාවය රැකෙන පරිදි බැංකුවේ කටයුතු සිදු කර ගැනීමට ප්‍රමාණවත් ධාරිතාවක් සහිත, අවම පිරිවැයක් දරා විදුලි ජනක යන්ත්‍රයක් ලබාගැනීම වඩාත් සුදුසු වේ. ලබාගන්නා විදුලි ජනක යන්ත්‍රය සඳහා දිනකට දැරිය හැකි උපරිම කුලී මුදල රු.5000/- ක් විය යුතුය.

03. සමෘද්ධි බැංකු/ බැංකු සමිති සතුව හෝ බැංකුව විසින් කුලී පදනම මත ලබාගත් විදුලි ජනක යන්ත්‍ර සඳහා අවශ්‍ය ඉන්ධන මිලට ගැනීමට අවශ්‍ය මුදල් පාලක මණ්ඩල/ විධායක කමිටු ආවර්ණ හෝ පෙර අනුමැතිය මත ලබාගැනීමට ඉඩ දෙනු ලැබේ.

04. සූර්යය බලය යොදා ගනිමින් සමෘද්ධි බැංකු කටයුතු සහ පරිගණක මෘදුකාංගය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යෝජනා දැනටමත් ලබා දෙන ලෙස දන්වා ඇති අතර, ඔබ විසින් එම යෝජනා 2022.05.01 දිනට පෙර අප වෙත ඉදිරිපත් කරන ලෙස ද කාරුණිකව දන්වමි.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
5. සහකාර අධ්‍යක්ෂ, තොරතුරු තාක්ෂණ අංශය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
6. ප්‍රාදේශීය ලේකම්වරුන්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - අ.ක.ස.
7. නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ සහකාර අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - අ.ක.ස


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |